ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1980 අංක 23 දරන විදේශීය ණය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූනි මස 6 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1980 ජූනි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 23 දරන විදේශීය ණය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූනි මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 29/80

**1957 අංක 29 දරන විදේශීය ණය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 23 දරන විදේශීය ණය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1957 අංක 29 දරන පනතෙහි දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1957 අංක 29 දරන විදේශීය ණය පනතෙහි දීර්ඝ නාමය, මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :—

"ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණය සම්බන්ධයෙන් ද, රාජ්‍ය සංස්ථාවලට සහ පොදු ව්‍යවසාය වලට දෙනු ලබන විදේශීය ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇපවනු පිණිස ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන සහ 4 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන, 3 වන සහ 4 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:—

"ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණය වලට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කරනු ලබන ඇපවීම්වලට අදාළ එකඟවීම් යනාදිය අත්සන් තැබීමට බලය පවරා ඇති තැනැත්තා.

2. ජනාධිපතිවරයා විසින් හෝ, ජනාධිපතිවරයා විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්—

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණයකට අදාළ එකඟවීමකට ;

(ආ) රාජ්‍ය සංස්ථාවකට නැතහොත් පොදු ව්‍යවසායකට දෙනු ලබන විදේශීය ණයකට අදාළව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කරනු ලබන ඇපවීමකට ; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ලියා අත්සන් තබනු ලැබිය යුතු යයි එම එකඟවීම නැතහොත් ඇපවීම මගින් නියමිත යම් ගිවිසුමකට, බැඳුම්කරයකට, පොරොන්දු පත්‍රයකට, හෝ වෙනත් ලේඛනයකට

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව නමින් සහ ඒ ආණ්ඩුව වෙනුවෙන් අත්සන් තබනු ලැබිය හැකි ය.

ඒ 49772 - 10,250 (0/05)

එකගවීම් සහ ඇපවීම් යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙවනු ලැබිය යුතු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව.

3. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්—

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණයකට අදාල එකගවීමක් යටතේ ;

(ආ) රාජ්‍ය සංස්ථාවකට නැතහොත් පොදු ව්‍යවසායකට දෙනු ලබන විදේශීය ණයකට අදාල ඇපවීමක් ප්‍රකාර ; සහ

(ඇ) එවැනි එකගවීමක් නැතහොත් ඇපවීමක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා අත්සන් තබන ලද යම් ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ පොරොන්දු පත්‍රයක් යටතේ

ගෙවනු ලැබිය යුතු සියලු මුදල් මෙයින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබේ.

විදේශීය ණයකට අදාල එකගවීමක් නැතහොත් ඇපවීමක් ක්‍රියාවේ යෙදවීම පිණිස විධිවිධාන සැලසීමෙහි ලා මුදල් අමාත්‍යවරයාගේ බලය.

4. (1) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණයකට අදල එකගවීමක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් හෝ පොදු ව්‍යවසායක් වෙත දෙනු ලබන විදේශීය ණයකට අදලව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කරනු ලබන ඇපවීමක් බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදා පළ කරනු ලබන සෑම නියමයක් ම නීතියක බලය දරන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදා පළ කරනු ලබන සෑම නියමයක් ම, එම නියමය කර මාසයක් ඇතුළත දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'අර්ථ නිරූපණය.

5. මේ පනතෙහි—

"විදේශීය ණය" යන්නෙන්—

(අ) විදේශීය ආණ්ඩුවක් විසින් හෝ විදේශීය ආණ්ඩුවක නියෝජ්‍යායතනයක් විසින් ; හෝ

(ආ) කිසියම් ජාත්‍යන්තර සංවිධානයක් විසින් ; නැතහොත්

(ඇ) පොදු වශයෙන් හෝ කිසියම් විශේෂ ගනුදෙනුවක් වෙනුවෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබිය

හැසි වූ ද, ශ්‍රී ලංකාවෙන් පිටත වූ ද සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නො ලැබූ යම් තැනැත්තකු විසින් නැතහොත් පුද්ගල මණ්ඩලයක් විසින්

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත හෝ රාජ්‍ය සංස්ථාවක් නැතහොත් පොදු ව්‍යවසායක් වෙත හෝ ප්‍රදානය කරනු ලබන, ඕනෑම ව්‍යවහාර මුදලක ණයක් අදහස් වන අතර, අවස්ථෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, රාජ්‍ය සංස්ථාව හෝ පොදු ව්‍යවසාය සහ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු අතර යම් ගනුදෙනුවක් වෙනුවෙන්, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ පොදු ව්‍යවසායේ යම් බැඳීමක් නිදහස් කරන්නා වූ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ රාජ්‍ය සංස්ථාව විසින් හෝ පොදු ව්‍යවසාය විසින් එවැනි යම් විදේශීය ආණ්ඩුවකට, නියෝජ්‍යායතනයකට, සංවිධානයකට, තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවීමට භාරගනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ද ඊට ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥා පනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"පොදු ව්‍යවසාය" යන්නෙන් සමාගම් ආඥා පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද ගෙවා ඇති ප්‍රාග්ධනයෙන් සියයට පණහකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් දරනු ලබන්නා වූ ද යම් සමාගමක් අදහස් වේ.'.